# <u>ශ්‍රී ලංකාව තුළ පරිගණක සාක්ෂරතාව ඉහළ යන නැඹුරුවක්</u>

ආචාර්ය අමර සතරසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 05 – 69 ත් අතර ජනගහනයේ පරිගණක සාක්ෂරතාව හා ශ්‍රී ලංකාවේ නිවාස ඒකක වෙත මෙම තාක්ෂණය කොතෙක් දුරට ළඟා වී ඇද්ද? යන්නත් විමසා බැලීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් 2006/2007 වසරේදී සමීක්ෂණයක් පවත්වන ලදි. මෙම සමීක්ෂණය උතුරු පළාතත් නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයත් හැර අන් සියළුම දිස්ත්‍රික්කවල පවත්වන ලදි.

වෙනත් විකල්ප තිබුණද විදුලි බලය පරිගණක හා තොරතුරු තාක්ෂණයට අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් වේ. මෙම සමීක්ෂණයෙන් අනාවරනයවූ පරිදි ශ්‍රී ලංකාවේ නිවාස ඒකකවලින් විදුලි බලය ඇති නිවාස ඒකක ප්‍රතිශතය 80.2% ක් වැනි ඉතා ඉහළ අගයක් ගනී. තව ද නාගරික අංශයේ සියළුම ගෘහ ඒකකවලට පාහේ (94% ක්) විදුලි බලය ඇත.



ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා රජය මඟින් විවිධ පියවර ගෙන ඇත. මේ අතුරින් විදාතා, නැණසල වැනි ආයතන පිහිටුවීම වැදගත් ස්ථානයක් ගනී. ගෘහ ඒකකවලින් ¼ ක් පමණ මෙම මධ්‍යස්ථාන පිළිබඳ අවබෝධයක් ඇති එක් සාමාජිකයෙකු හෝ සිටින බව වාර්තා වී ඇත.

2004 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ගෘහ ඒකක අතුරින් එක් පරිගණක යන්ත්‍රයක් හෝ තිබුණේ නිවාස ඒකක 3.8% කට පමණි. 2006 වසර වනවිට මෙම ප්‍රතිශතය 8.2% දක්වා වැඩිවී ඇත. මේ වනවිට නාගරික අංශයේ ගෘහ ඒකකවලින් ආසන්න වශයෙන් 1/5 කට පමණ එක් පරිගණක යන්ත්‍රයක් හෝ ඇත. වතු අංශයේ ද මෙම ප්‍රවනතාවය දැකිය හැකි අතර 2004 වසරේදී 0.3% ක් ව පැවති මෙම ප්‍රතිශතය 2006 වනවිට 1.1% ක් දක්වා වැඩි වී ඇත.

මෙම සමීක්ෂණයේදී සොයා බැලූ තවත් එක් කරුණක් වන්නේ ගෘහ ඒකකවලට පරිගණක ලබාගෙන ඇත්තේ කුමන කාලවලදීද යන්නයි. දැනට ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකවල පවතින පරිගණක යන්ත්‍රවලින් 47.0% ක්ම ලබාගෙන ඇත්තේ පසුගිය වසර දෙක තුළ දී වේ.

ශ්‍රී ලංකාවේ විද්‍යුත් තැපැල් පහසුකම් සහිත නිවාස ඒකක ප්‍රතිශතය 2004 වසරේදී 0.9% ක් වූ අතර එය මේ වනවිට 2.3% ක් දක්වා ඉහළ ගොස් ඇත. තව ද පරිගණකයක් සහිත නිවාස ඒකකවලින් 27 % කට විද්‍යුත් තැපැල් පහසුකම් ඇත.

අන්තර්ජාල පහසුකම් සහිත ගෘහ ඒකක ප්‍රතිශතය 2004 වර්ෂයේදී 0.7% ක් වූ අතර එය 2006 වසර වනවිට 2.4% දක්වා ඉහළ ගොස් ඇත. මෙම ප්‍රතිශතය පරිගණක යන්ත්‍රයක් සහිත ගෘහ ඒකකවලින් 28.6% ක් වැනි ඉහළ අගයක් ගනී.

ඇතැමුන්හට පරිගණකයක් භාවිතා කල නොහැකි වුවත් ඒවා භාවිතයෙන් කලහැකි දෑ පිළිබඳව සුළු වශයෙන් හෝ දැනුවත්ය. 2004 වසර හා සන්සන්දනය කරන විට 2006 වසරේදී වයස අවුරුදු 05 – 9 ත් අතර පුරවැසියන්ගේ පරිගණක පිළිබඳ දැනුවත්භාවය 18.2% සිට 37.1% දක්වා වැඩි වී ඇත.

මෙම සමීක්ෂණයේදී යමෙකුට පරිගණකයක් භාවිතයෙන් කුමන හෝ කාර්යයක් කලහැකි නම් ඔහුට/ඇයට පරිගණක සාක්ෂරතාව ඇතැයි සලකන ලදී. මෙහිදී කාර්යය පිළිබඳව සැලකිලිමත් නොවිණි. උදාහරණයක් වශයෙන් ගතහොත් මෙහිදී වයස අවුරුදු 05 ක් වූ අයෙකුට පරිගණකයක් භාවිතයෙන් කිසියම් ක්‍රීඩාවක් කලහැකි නම් ඔහුට/ඇයට පරිගණක සාක්ෂරතාව ඇතැයි සලකනු ලැබීය. මෙම අර්ථ දැක්වීම අනුව 2004 වර්ෂයේදී 9.7% ක් වූ පරිගණක සාක්ෂරතාව 2006 වසරේදී 16.1% ක් තරම් ඉහළ ගොස් ඇත.

පරිගණක සහ තොරතුරු තාක්ෂණය බොහෝසෙයින් ජනප්‍රියවීමට එක් හේතුවක් වූයේ විවිධ කටයුතු සඳහා යොදාගත හැකි සරල මෘදුකාංග බිහිවීමය. ඇතැම් රටවල පරිගණක සාක්ෂරතාව අර්ථ දැක්වීමේදී මෘදුකාංග භාවිතා කිරීමේ හැකියාව ද ඇතුලත් කොට ඇත. 2006 වසරේදී පැවති සමීක්ෂණයට අනුව වයස අවුරුදු 05 – 69 ත් අතර ජනගහනයෙන් 11.4% කට අඩු වශයෙන් පරිගණක මෘදුකාංග දෙකක්වත් භාවිතා කලහැකි බව අනාවරණය විය.

විද්‍යුත් තැපැල පනිවිඩ හුවමාරුවේදී අතිශයින්ම ජනප්‍රිය වී ඇති අතර එමඟින් ඉතා පහසුවෙන් සහ ඉතා ඉක්මනින් පනිවිඩ හුවමාරු කල හැක. ශ්‍රී ලංකාවේ වයස 05 – 69 ත් අතර ජනගහනයෙන් 2006 වසර වනවිට 2.8% කට තමන් විසින්ම විද්‍යුත් තැපැල භාවිත කලහැකි බව හෙළිදරව් වුණි. විද්‍යුත් තැපැල පිළිබඳ අවබෝධයක් ඇති අයගෙන් 41.5% ක් පසුගිය වසර තුළ අඩු වශයෙන් එක් වරක් හෝ විද්‍යුත් තැපැල භාවිතා කොට ඇත.

මෙම සමීක්ෂණයෙන් විද්‍යුත් තැපැල පිළිබඳ අනාවරණය වූ තවත් කරුණක් වන්නේ විද්‍යුත් තැපැල පිළිබඳ අවබෝධයක් ඇති අයගෙන් 30.2% කට තමාගේම විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇති බවය.

අන්තර්ජාලය විවිධ අවශ්‍යතා සඳහා යොදා ගනී. තොරතුරු ලබා ගැනීම, බැංකු සේවා, භාණ්ඩ හා සේවා මිලදී ගැනීම මේ අතර වේ. 2004 වසරේදී වයස 05 – 69 ත් අතර ජනගහනයෙන් තමා විසින්ම අන්තර්ජාලය භාවිතා කලහැකි යැයි හෙළිදරව් වූයේ 2.6% කට පමණි. එහෙත් 2006 වසර වනවිට එම ප්‍රතිශතය 5.0% ක් දක්වා ඉහළ ගොස් ඇත. තව ද අන්තර්ජාල පිළිබඳ අවබෝධයක් ඇති අයගෙන් 45.2% ක්ම පසුගිය මාස 12 ඇතුලත කුමන හෝ කටයුත්තක් සඳහා අන්තර්ජාලය භාවිතා කොට ඇත.

පරිගණකයක් ඇති නිවාස ඒකකවලින් පරිගණක ක්‍රියාවිරහිතවීම් පිළිබඳව මෙම සමීක්ෂණයේදී සොයා බලන ලදී. මෙහිදී අනාවරණය වූයේ එම නිවාස ඒකකවලින් 36% ක් පමණ නිවාස ඒකකවල වූ පරිගණකවලින් අඩු වශයෙන් එක් පරිගණකයක් හෝ ක්‍රියාවිරහිත වී ඇති බවයි. එහෙත් එවැනි පරිගණක ක්‍රියාවිරහිතවීම් වාර්තා කල නිවාස ඒකකවලින් අඩක් පමණ සති දෙකක් ඇතුලත ක්‍රියාවිරහිත වූ පරිගණක අළුත්වැඩියා කොට ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ තොරතුරු සහ පරිගණක සාක්ෂරතාව වෙනත් රටවල් හා සන්සන්දනය කිරීම තරමක් දුරට අපහසුය. මීට හේතු වන්නේ එම රටවල් භාවිතා කරන අර්ථ දැක්වීම් මෙම සමීක්ෂණයේදී භාවිතා කල අර්ථ දැක්වීමවලට වඩා වෙනස් වීමත් වෙනත් රටවල සමීක්ෂණ පවත්වා ඇති

කාලවකවානුවල ඇති වෙනස්කමුත් නිසාය. පරිගණක සහිත නිවාස ඒකකවල ප්‍රතිශතය 2003 වර්ෂය සඳහා බොහෝ රටවල් ඇස්තමේන්තු කොට ඇත. එම වසරේදී ඉන්දුනීසියාව, ඉන්දියාව සහ රුසියාව යන රටවල පරිගණකයක් සහිත නිවාස ඒකක ප්‍රතිශතය 2% ක්, 4% ක් සහ 8% ක් ලෙස වාර්තා වී ඇත. එහෙත් එම වසර සඳහා ම සිංගප්පූරුව, කොරියාව යන රටවල් සඳහා ඇස්තමේන්තු කොට ඇති ප්‍රතිශත පිළිවෙලින් 68% ක් සහ 78% ක් වේ. 2006 වසර සඳහා ශ්‍රී ලංකාවේ පරිගණකයක් සහිති නිවාස ඒකක ප්‍රතිශතය 8.2% කි.

2005 වසරේදී යුරෝපීය රටවල්වල අන්තර්ජාල පහසුකම් සහිත නිවාස ඒකකවල ප්‍රතිශත නිකුත් කොට ඇත. මෙම සංඛ්‍යාතිවලට අනුව ලිතුවේනියාව, හංගේරියාව, ග්‍රීසිය යන රටවල අන්තර්ජාල පහසුකම් සහිත නිවාස ඒකකවල ප්‍රතිශතය පිළිවෙලින් 18% ක් 22% ක් හා 22% ක් වේ. තව ද නෙදර්ලන්තය හා අයිස්ලන්තය සඳහා මෙම ප්‍රතිශත පිළිවෙලින් 76% ක් 84% ක් වේ. 2006 වසරේදී ශ්‍රී ලංකාව සඳහා ඇස්තමේන්තු කල මෙම ප්‍රතිශත 2.4% ක් වේ.

2003 වසරේදී ආසියානු රටවල් සඳහා අන්තර්ජාල පහසුකම් සහිත ගෘහ ඒකක ප්‍රතිශතවල ඇස්තමේන්තු විවිධ ආයතන මඟින් නිකුත් කොට ඇත. මෙම ඇස්තමේන්තුවලට අනුව ඉන්දුනීසියාව, ඉන්දියාව, පිලිපීනය යන රටවල් සඳහා අන්තර්ජාල පහසුකම් සහිත නිවාස ඒකක ප්‍රතිශතය පිළිවෙලින් 1% ක් 2% ක් හා 4% ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. එම ප්‍රතිශත සිංගප්පූරුව සහ කොරියාව යන රටවල් සඳහා පිළිවෙලින් 65% ක් 69% ක් ලෙස වාර්තා වී ඇත.

මෙම සමීක්ෂණ වාර්තාවෙහි ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 05 – 69 ත් අතර ජනගහනයේ තොරතුරු සහ පරිගණක සාක්ෂරතා මට්ටම් පිළිබඳව ද නිවාස ඒකක තුළට මෙම තාක්ෂණය කොතෙක්දුරට ළඟා වී ඇද්ද යන්න පිළිබඳවද දර්ශක රැසක් අන්තර්ගත කොට ඇත. එම නිසා එම වාර්තාවේ අඩංගු දත්ත කොතෙක්දුරට ශ්‍රී ලංකාව තුළ පරිගණක සහ තොරතුරු තාක්ෂණය භාවිතා වන්නේ ද යන්න විමසා බැලීමටත් ඉදිරියේදී මෙම තාක්ෂණය ශ්‍රී ලංකාව තුළ සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම ඉලක්ක කරගත් සැලසුම් පිළියෙල කිරීම පිළිබඳ තීරණ ගැනීමට ද උපකාරි වේ. මෙම සමීක්ෂණයට අමතරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් රජයේ පාසැල් සහ පිරිවෙන් වල ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාව පිළිබඳ සංගණනයක් 2006 වසරේ දි පවත්වන ලදි. තවද 2006 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව පිළිබඳ සංඛ්‍යාති ද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරන ලදි.

## ශ්‍රී ලංකාවේ ගෘහ ඒකක ආශ්‍රිත තොරතුරු හා පරිගණක සාක්ෂරතාව පිළිබඳ මූලික දර්ශක

| අංකය | දර්ශකය | 2004 | 2006 |
|---|---|---|---|
| **A.** | **ගෘහ ඒකක ප්‍රතිශතය** | **%** | **%** |
| 01 | විදුලි බලය සහිත | - | 80.2 |
| 02 | ගුවන් විදුලි යන්ත්‍රයක් සහිත | - | 80.1 |
| 03 | රූපවාහිනී යන්ත්‍රයක් සහිත | - | 76.3 |
| 04 | රැහැන්ගත දුරකතනයක් සහිත | - | 30.4 |
| 05 | ජංගම දුරකතනයක් සහිත | - | 36.6 |
| 06 | ෆැක්ස් යන්ත්‍රයක් සහිත | - | 0.9 |
| 07 | අඩු වශයෙන් එක සාමාජිකයෙකු හෝ රජයේ පරිගණක සම්පත් මධ්‍යස්ථාන පිළිබඳ දැනුමක් ඇති | - | 24.7 |
| 08 | පරිගණක යන්ත්‍රයක් (ජාතික මට්ටමේ) | 3.8 | 8.2 |
| | 08a නාගරික අංශය | 10.5 | 17.8 |
| | 08b ග්‍රාමීය අංශය | 3.1 | 6.9 |
| | 08c වතු අංශය | 0.3 | 1.1 |
| 09 | පරිගණකය පසුගිය වසර දෙක තුළ ලබාගත් | 44.2 | 47.0 |
| 10 | ලැප්ටොප් පරිගණකයක් සහිත | - | 0.9 |
| 11 | විද්‍යුත් තැපැල් පහසුකම් සහිත | 0.9 | 2.3 |
| 12 | අන්තර්ජාල පහසුකම් සහිත | 0.7 | 2.4 |
| **B.** | **ගෘහ ඒකක** | | |
| 13 | පරිගණක යන්ත්‍රයක් ඇති නිවාස ඒකක අතුරින් මුද්‍රණ යන්ත්‍රයක් ඇති ගෘහ ඒකක ප්‍රතිශතය | 41.8 | 39.0 |
| 14 | පරිගණක යන්ත්‍රයක් ඇති නිවාස ඒකක අතුරින් සංයුක්ත තැටි ධාවකයක් ඇති ගෘහ ඒකක ප්‍රතිශතය | 58.9 | 82.3 |
| 15 | පරිගණක යන්ත්‍රයක් ඇති නිවාස ඒකක අතුරින් විද්‍යුත් තැපැල් පහසුකම් ඇති ගෘහ ඒකක ප්‍රතිශතය | 24.7 | 27.3 |
| 16 | පරිගණක යන්ත්‍රයක් ඇති නිවාස ඒකක අතුරින් අන්තර්ජාල පහසුකම් ඇති ගෘහ ඒකක ප්‍රතිශතය | 19.2 | 28.6 |
| 17 | පරිගණක යන්ත්‍රයක් ඇති නිවාස ඒකක අතුරින් පරිගණක යන්ත්‍රය ක්‍රියාවිරහිත වීම වාර්තා කල (පසුගිය මාස 12 තුළ) ගෘහ ඒකක ප්‍රතිශතය | - | 36.0 |
| **C.** | **වයස අවුරුදු 05 – 69 ත් අතර ගෘහ ඒකක ජනගහනයේ ප්‍රතිශතය** | | |
| 18 | පරිගණකයකින් කෙරෙන කරුණු පිළිබඳව අවබෝධයක් ඇති | 18.2 | 37.1 |
| 19 | පරිගණක සාක්ෂරතාවය ඇති | 9.7 | 16.1 |
| 20 | අඩු වශයෙන් මෘදුකාංග 2 ක් භාවිතා කලහැකි | - | 11.4 |
| 21 | තනිවම විද්‍යුත් තැපෑල භාවිතා කලහැකි | 2.8 | 5.2 |
| 22 | තනිවම අන්තර්ජාලය භාවිතා කලහැකි | 2.6 | 5.0 |
| 23 | අඩු වශයෙන් එක වරක් හෝ ජංගම දුරකතනයක් භාවිතා කොට ඇති | - | 46.1 |
| **D.** | **වයස අවුරුදු 05 – 69 ත් අතර ජනගහනය** | | |
| 24 | විද්‍යුත් තැපෑල පිළිබඳ අවබෝධයක් ඇති අයගෙන් අඩු වශයෙන් එක් වරක් හෝ විද්‍යුත් තැපෑල භාවිතා කොට ඇති | - | 41.5 |
| 25 | අන්තර්ජාලය පිළිබඳ අවබෝධයක් ඇති අයගෙන් එක් වරක් හෝ අන්තර්ජාලය භාවිතා කොට ඇති | - | 45.2 |
| 26 | විද්‍යුත් තැපෑල පිළිබඳ අවබෝධයක් ඇති අයගෙන් විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇති | - | 30.2 |